## නිපුණතා පාදක විෂය නිර්දේශය

# මූලික පිරිවෙණ

3,4,5 ශ්‍රේණි

# ඉතිහාසය

(2017 සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය - ඉසුරුපාය - බත්තරමුල්ල

ඉතිහාසය

03, 04, 05 ශ්‍රේණි

මූලික පිරිවෙන් නිපුණතා පාදක නව විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය - 2016
මුද්‍රණය සහ බෙදාහැරීම
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

වෙබ් අඩවිය : www.moe.gov.lk/ pirivena
විද්‍යුත් තැපැල : piriven@moe.gov.lk

හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදයේ අංක 67හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරන ලදි.

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන්ගේ පණිවුඩය

ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම කලින් කලට අධ්‍යාපනයට අදාළ නව විෂය නිර්දේශ හඳුන්වා දීම හෝ පවත්නා විෂය නිර්දේශ සංස්කරණය කිරීම කරනු ලබයි. මෙමගින් විෂය නිර්දේශයේ අන්තර්ගතය කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස්කර ගැනීමටත් විෂය නිර්දේශය නව ආකෘතියකින් ඉදිරිපත් කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු හා සාර්ථක කරගන්නටත් අවස්ථාව සැලසේ.

අනූව දශකයේ දී ජාතික අරමුණු නවයක් හා පොදු නිපුණතා පහක් සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කොට ගෙන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කරනු ලැබිණ. මෙම සහස්‍රදයේ විෂය නිර්දේශ සකස් කිරීමේ දී යොදා ගන්නා ලද්දේ නිපුණතා පාදක ක්‍රමයයි. මෙම ක්‍රමය පාසල් අධ්‍යාපනයට හඳුන්වා දී දැනට වසර කීපයක් ම ගත වී හමාරයි. ඒ අනුව නවීන අධ්‍යාපන ක්‍රමවේදයක් වන නිපුණතා පාදක ඉගැන්වීම් ක්‍රමය පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ද හඳුන්වා දීම අපේ අරමුණයි. පහත දැක්වෙන්නේ නිපුණතා පාදක ක්‍රමය පිළිබඳ පිළිගත් විග්‍රහයකි.

"කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ අත්‍යවශ්‍ය විෂය කරුණු, මූලධර්ම හා ක්‍රම ශිල්ප ප්‍රායෝගික ආකාරයෙන් සුසංයෝගී ලෙස යොදා ගැනීමේ හැකියාව නිපුණතාවයි."

(අධ්‍යාපන විශ්වකෝෂය)

සැකෙවින් කිවහොත් නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී වී ගොඩ නැගෙන ජීවිත පුරුද්දකි. ධනාත්මක ජීවිත පුරුදු ඇති කිරීම නිපුණතා පාදක විෂය නිර්දේශයක අරමුණයි.

නිවැරදි, පැහැදිලි හා විධිමත් විෂය නිර්දේශයක් ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් එක සේ වැදගත් වෙයි. විෂය නිර්දේශයෙන් පෙන්වා දෙන මාර්ගයේ ශිෂ්‍යයා කැඳවා ගෙන යාම ගුරුවරයාගේ කාර්යයයි. එම ගමන නිමා විය යුත්තේ ශිෂ්‍යයා විසින් ඉගෙනුම් පල අත්පත් කර ගැනීමෙනි. එවිට ශිෂ්‍යයාට මෙන් ම ගුරුවරයාට ද ඉගෙනුම් පල දැකීමෙන් සතුටට පත්විය හැකි ය.

කලකට පෙර පිරිවෙන් අධ්‍යාපනයට ම ආවේණික වූ විෂය නිර්දේශයක් විය. එහෙත් කාලයත් සමඟ පිරිවෙන් විෂය නිර්දේශය පාසල් විෂය නිර්දේශය තුළ නිමග්න වී ඇතුවා සේය. මේ නිසා ගිහි ශිෂ්‍යයාගේ අරමුණු හා ආකල්ප පැවිදි ශිෂ්‍යයාට ද නිරායාසයෙන් උරුම වෙමින් පවතී. ඒ හේතුවෙන් පැවිදි ශිෂ්‍යයා තමන්ට අදාළ ඉලක්ක වෙනුවට ගිහි ශිෂ්‍යයාගේ ඉලක්ක කරා ගමන් කිරීමෙන් ගමන නිමාවන බවක් දක්නට ලැබෙයි. මේ තත්ත්වය මත පාසල් අධ්‍යාපනයට අදාළ වූ විෂයයක් වුවද පිරිවෙණේ ඉගැන්විය යුත්තේ පැවිද්දාට අදාළ ආකල්ප හා කුසලතා වර්ධනය කරවන පිරිවෙණට ම ආවේණික විෂය නිර්දේශයක් ඔස්සේ ය.

මේ තාක් ලෝකයේ අධ්‍යාපන අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක ගත වී පැවතියේ භෞතික දියුණුව සාර්ථක කර ගනු පිණිස ය. එහෙත් දියුණු ලෝකයේ රටවල් මේ වන විටත් එහි අනිසි විපාක අත් විඳිමින් සිටින බැවින් අනාගත ලෝකයේ අධ්‍යාපනික අරමුණු සකස් වෙමින් පවත්නේ භෞතික දියුණුව මෙන් ම ආධ්‍යාත්මික ශික්ෂණය ද අරමුණු කොටගෙන ය. එබැවින් පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශ මගින් එකී අවශ්‍යතාව ඉටුකර ගැනීම අපගේ අරමුණයි.

මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඥාණරතන හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නමැති විද්‍යායතනය බිහි විය. පැවිදි ගිහි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්ය භාරය සුළු කොට තැකිය නොහැකි ය.

පිරිවෙණේ අධ්‍යාපනය ලබන පැවිදි ගිහි සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීමට සහ පරිවේණාචාර්යවරුන්ගේ ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශ මුද්‍රණය කර ප්‍රථම වරට ලබා දීමට හැකිවීම ඉමහත් සතුටකි.

අයි. එම්. කේ. බී. ඉලංගසිංහ
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2016.12.14

# විෂය නිර්දේශ කමිටුව

- **උපදේශකත්වය හා අනුමැතිය** - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
  මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි,
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **විෂය විශේෂඥ උපදේශනය**
  මහාචාර්ය ඒ. එච්. එම්. එම්. අභයරත්න - සමාජ විද්‍යාපීඨය කැලණිය විශ්වවිද්‍යාලය.

  ඩී. එච්. චන්දිමා නිෂානි ධර්මපාල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
  ජාතික අධ්‍යාපන ආයතනය.

  එස්. ඒ. සී. දිසානායක - ව්‍යාපෘති නිලධාරි(විශ්‍රාමික)
  ජාතික අධ්‍යාපන ආයතනය.

  හේමපාල පෙරේරා - පරිවෙණාචාර්ය (විශ්‍රාමික),
  සුනේත්‍රා මහාදේවි විද්‍යායතන පිරිවෙණ,
  පැපිලියාන.

- **විෂය සම්බන්ධීකරණය**
  ජයසේන ගුණවර්ධන - විෂය උපදේශක (පිරිවෙන්),
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

- **ලේඛක මණ්ඩලය**
  පූජ්‍ය නෙළුවේ නන්ද හිමි - පරිවෙණාචාර්ය,
  ජයමග මහපිරිවෙණ, හිඟුරක්ගොඩ.

  ඒ. එම්. සෙනෙවි රත්න බණ්ඩා - පරිවෙණාචාර්ය (විශ්‍රාමික).
  ශ්‍රී විජය මහපිරිවෙණ, සැඟැලෙන

  ජයසේන ගුණවර්ධන - විෂය උපදේශක (පිරිවෙන්),
  පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
  අධ්‍යාපන අමාත්‍යාංශය.

  ආර්. එම්. හිතේෂි රත්නායක - පරිවෙණාචාර්ය,
  ශ්‍රී ලංකා විද්‍යාලීය මහපිරිවෙණ, මරදන.

- **ලේඛකමණ්ඩලය (අභ්‍යන්තර)**

  ඩී. එච්. චන්දිමා නිෂානි ධර්මපාල - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,
  ජාතික අධ්‍යාපන ආයතනය.

  ඩී. එම්. ජයන්ත පුෂ්ප කුමාර - සහකාර කොමසාරිස්,
  අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

- **පරිගණක තාක්ෂණික සහය**
  ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්න - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

  ධනුෂිකා නිමන්ති ගුණවර්ධන

- **පිටකවර නිර්මාණය**
  පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# විෂය හැඳින්වීම

අපේ රට, මේ සුන්දර දිවයින, ශ්‍රී ලංකාව ලෝක සිතියමේ දිස්වෙන්නේ ඉන්දියන් සාගරයේ පිහිටා ඇති ඉතාමත් ම පුංචි දූපතක් වශයෙනි. අප රට ගැන කතා කරන හැම කෙනෙක් ම පාහේ පිළිගන්නා සත්‍යයක් වන්නේ මේ රට වසර දෙදහස් පන්සියයකට වඩා පැරණි, අඛණ්ඩ, පැහැදිලි, ලිඛිත ඉතිහාසයක් ඇති රටක් ලෙසට ය.

මේ ඉතිහාසය ගොඩ නැගීමේ පුරෝගාමියා වූයේ භික්ෂූන් වහන්සේ ය. ඉතිහාසය රන් අකුරින් ලියවුණේත්, අපට ප්‍රෞඪ ඉතිහාසයක් හිමි වූයේත් බුදු දහම හා භික්ෂුව නිසා ය. අදත් මෙහිලා භික්ෂුවගේ කාර්යභාරය අති විශාල ය. ඒ කාර්ය සාඵල්‍යත්වය සඳහා තම ඉතිහාසය ඉගෙන ගැනීම භික්ෂුවට අත්‍යවශ්‍ය ම අංගයකි . ලක්දිව ඉතිහාසය යනු බෞද්ධ ඉතිහාසයයි. ලංකා ඉතිහාසයත් ලෝක ඉතිහාසයත් එයට අඩංගු ය.

අද ලාංකික සමාජය තුළ පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසුන්ගේ විෂය ක්ෂේත්‍ර මෙන්ම විෂය පථයන් ද කෙමෙන් පුළුල් වී හෝ වෙනස් වී ඇත. යුගයේ අවශ්‍යතාවන් අනුව ඒවා එසේ වෙනස් නොවන්නේ නම් සිදුවන්නේ පිරිවෙන් ශිෂ්‍යයා විශේෂයෙන් ම, අපේ පුංචි හාමුදුරුවෝ සීමාසහිත විෂය ධාරාවක, විෂය පථයක හිරවීමකි. ඒ අනුව වත්මන් සමාජයට, ලෝකයට මුහුණ දීමේ දී උද්ගත වන විවිධ ප්‍රශ්න හඳුනාගැනීමේ දී ඉතිහාසය නොදැනීම බලවත් අඩුපාඩුවක් බව අමුතුවෙන් ප්‍රකාශ කළයුතු නැත.

වර්තමානය මැනවින් තේරුම් ගැනීමට නම් අතීත සමාජයන්හි පැවති දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික කේෂත්‍රවල මතු වූ යම් යම් ගැටලු හා ජයග්‍රහණවල විවිධාකාර තත්ත්වයන් විවිධ ස්ථර හෙවත් පැතිකඩ ඔස්සේ සාකච්ඡා කර, අධ්‍යයනය කර, අවබෝධ කරගත යුතු ය. ඒවා පිළිබඳ ව මෙසේ මැනවින් අධ්‍යයනය කොට තුලනාත්මක ව, විවේචනාත්මක ව හා විමර්ශනාත්මක ව ක්‍රියා කිරීම ඉතිහාසය ඉගෙනීම තුළින් අපේක්ෂිත ය.

2017 වර්ෂයේ සිට මූලික පිරිවෙන්වල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව විෂය නිර්දේශය ශිෂ්‍ය කේන්ද්‍රීය ව කරනලද විවිධ පරීක්ෂණ, නිරීක්ෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵලයකි. ඒ අනුව මෙම විෂය නිර්දේශ තුළ සෑම විෂයකම විෂය අන්තර්ගතය ශිෂ්‍ය නිපුණතා හා නිපුණතා මට්ටම් යටතේ ගොඩනගා තිබීම විශේෂත්වයකි.

මෙම නිපුණතා මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව හා අපේ උරුමය පිළිබඳ ව අවබෝධ කර ගැනීමටත්, ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය හඳුනා ගැනීමටත් ඉඩ සලසා ඇත.

ජයසේන ගුණවර්ධන,
විෂය උපදේශක (පිරිවෙන්),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# විෂය අධ්‍යයනයේ අරමුණු
## (3, 4, 5 ශ්‍රේණි)

1. මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිවහල් ව, නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම.

2. අතීතය මත පදනම්ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම්ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායී කරලීම වර්ධනය කර ගැනීම

3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දෑ හිතකාමී පුරවැසියෙකු බවට පත්වීම.

4. ඓතිහාසිකව වැදගත් භූමිකා ඉටු කළ පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම.

5. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳ ව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.

6. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම.

7. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහා ගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම.

8. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම..

9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.

10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණුකර ගැනීම.

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - ඉතිහාසය -3 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 1.1 ඉතිහාසය යනු කුමක් ද යි විමසා බලයි.<br><br>1.2 ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය අධ්‍යයනය කරයි. | • ඉතිහාසය හඳුන්වා දීම.<br>• නිර්වචන අධ්‍යයනය කිරීම.<br>• ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම.<br>• ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සමය.<br>• ශ්‍රී ලංකාවේ ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය.<br>• අනුරාධපුර රාජධානි සමයේ ශ්‍රේෂ්ඨ රජවරු (පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වලගම්බා, වසභ, ධාතුසේන) | • ඉතිහාසය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• ඉතිහාසය පිළිබඳ ව ඇති සරල නිර්වචන අර්ථ දක්වයි.<br>• ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගය විස්තර කරයි.<br>• අනුරාධපුර යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයින් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• මුල් ජනාවාස සිතියමක ලකුණු කරයි. | 26 |
| 02. ශ්‍රී ලංකාවේ පිරිවෙන් ඉතිහාසයේ ඓතිහාසික විකාශනය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 2.1 පිරිවෙන් ඉතිහාසයේ ආරම්භය හා විකාශනය විස්තර කරයි.<br><br>2.2 ඒ ඒ යුගවල ආරම්භ වූ පිරිවෙන් හා ඒවායේ ඓතිහාසික වැදගත්කම විස්තර කරයි | • පිරිවෙනේ ආරම්භය හා විකාශය<br>• පොළොන්නරු යුගයේ පැවති අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ<br>• කෝට්ටේ යුගයේ සුප්‍රකට පිරිවෙන් හා පඬිවරුන්.<br>• තොටගමුවේ විජයබා පිරිවෙණ හා කැරගල පද්මාවතී පිරිවෙණ වැනි ඓතිහාසික වැදගත්කමක් ඇති පිරිවෙන් ආදර්ශ වශයෙන් දක්වා පිරිවෙන් අධ්‍යාපනය හා විෂය පථය ගැන කෙටි හැඳින්වීමක් | • පිරිවෙන් ආරම්භය විස්තර කරයි.<br>• පැරණි පිරිවෙන් නම් කරයි.<br>• පිරිවෙන් අධ්‍යාපනයේ සුවිශේෂිතා පෙන්වා දෙයි | 15 |
| 03. ශ්‍රී ලංකාවේ පිරිවෙන්වල නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 3.1 පිරිවෙන් ඉතිහාසයේ නව පිබිදීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි | • වර්තමාන තත්ත්වය<br>• සාමාජිකයන් හා එහි සංයුතිය<br>• පිරිවෙන් පාලනය සහ පාලන සංවිධානය | • පිරිවෙන් අධ්‍යාපනයේ වර්තමාන තත්වය පැහැදිලි කරයි.<br>• පිරිවෙන් පාලන සංවිධානය පැහැදිලි කරයි.<br>• අතීත හා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය සසඳයි. | 11 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගෙන ඊට අනුගත වෙයි. | 4.1 ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනා ගනිමින් ඊට ගෞරව කරයි. | • ශ්‍රී ලාංකික අනන්‍යතාව පහදයි.<br>• ජාතික ලාංඡනය<br>• ජාතික කොඩිය<br>• ජාතික ගීය<br>• ජාතික වෘක්ෂය<br>• ජාතික පුෂ්පය<br>• ජාතික පක්ෂියා<br>• ජාතික ක්‍රීඩාව<br>• පිරිවෙන් ලාංඡනය | • ශ්‍රී ලාංකික අනන්‍යතාව පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙහි සංකේත විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකික අනන්‍යතාවට අනුගතව කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි | 10 |
| 05. ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය පෙන්වා දෙයි | 5.1 පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරවල සුවිශේෂ ලක්ෂණ විමසා බලයි. | • මානව ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ මූලික කරුණු.<br>• නයිල්, යුප්‍රටීස් - ටයිග්‍රීස්, හොවැංහෝ සහ ඉන්දු නිම්න ශිෂ්ටාචාරවල සුවිශේෂී ලක්ෂණ<br>• ලෝක සිතියමක් ආශ්‍රයෙන් අදාළ ගංගා නිම්න හඳුනාගෙන ලකුණු කොට නම් කිරීම | • මානවයාගේ ආරම්භයේ සිට නගර තනා ගැනීම දක්වා තොරතුරු විස්තර කරයි.<br>• පැරණි නාගරික ශිෂ්ටාචාරවල ප්‍රධාන ලක්ෂණ පෙන්වා දෙයි.<br>• පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර සිතියමක ලකුණු කර නම් කරයි. | 16 |

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - ඉතිහාසය -4 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 1.1 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා පොළොන්නරු රාජධානිය පිළිබඳ තොරතුරු විමසයි | • අනුරාධපුර රාජධානියේ පරිහානිය හා චෝල පාලනය.<br>• පොළොන්නරු රාජධානි සමයේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වැදගත්වන රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය.<br>• පොළොන්නරුව බිඳ වැටීම හා පසුකාලීන රාජධානි. | • අනුරාධපුර රාජධානිය පරිහානියට පත්වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• චෝල පාලනය පැහැදිලි කරයි.<br>• පොළොන්නරු යුගයේ ප්‍රධාන රජවරුන්ගේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික කටයුතු පැහැදිලි කරයි.<br>• පොළොන්නරු යුගය අවසන් වීමට හේතු දක්වයි. | 14 |
| | 1.2 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය අවසානය දක්වා දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික තොරතුරු විමසා බලයි | • දඹදෙණි, යාපහු, කුරුණෑගල හා ගම්පොල රාජධානි සමයන්හි දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වැදගත්වන රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය. | • පොළොන්නරු යුගයෙන් පසු බිහි වූ රාජධානි විස්තර කරයි.<br>• රජරට හා ඊට පසු බිහි වූ රාජධානි සිතියමක ලකුණු කර නම් කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 02. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 2.1 පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ පැවති දේශපාලනික, ආගමික හා ආර්ථික තත්ත්වය පැහැදිලි කරයි.<br>2.2 පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීම පැහැදිලි කරයි.<br>2.3 පෘතුගීසි ආගමනයෙන් පසු මෙරටට ඇති වූ බලපෑම් පෙන්වා දෙයි. | • 16 වන සියවසේ මුල් කාලයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය.<br>• යුරෝපීයයන් පෙරදිගට පැමිණීම කෙරෙහි බලපෑ ඓතිහාසික සාධක.<br>• සෙංකඩගල රාජ්‍ය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා.<br>• ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය.<br>• පෘතුගීසි ආගමනයේ විවිධ බලපෑම්. | • කෝට්ටේ රාජ්‍යයේ බෙදීයාම පිළිබඳ විස්තර කරයි.<br>• කෝට්ටේ පාලනය බෙදීයාම සිතියමක ලකුණු කරයි.<br>• යුරෝපීයන් පෙරදිගට පැමිණීමට හේතු දක්වයි.<br>• පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවා ගත් ආකාරය පැහැදිලි කරයි.<br>• පෘතුගීසීන්ගේ පාලනය විස්තර කරයි.<br>• පෘතුගීසීන්ගෙන් දේශපාලන, සමාජ, ආර්ථික වශයෙන් මෙරටට එක් වූ නව අංග පෙන්වා දෙයි.<br>• පෘතුගීසි පාලන ප්‍රදේශ සිතියමක ලකුණු කර නම් කරයි. | 12 |
| 03. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 3.1 ලන්දේසි බල ව්‍යාප්තිය විමර්ශනය කරයි. | • උඩරට රාජ්‍ය හා ලන්දේසින් අතර පැවති සබඳතා හා මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය තහවුරු වීම හා පාලනය.<br>• ලන්දේසි පාලනය යටතේ මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික ප්‍රවණතාවල වෙනස්වීම. | • ශ්‍රී ලංකාවේ ලන්දේසි බලය පැතිර වූ ආකාරය විස්තර කරයි.<br>• ලන්දේසි පාලනයෙන් මෙරටට එක් වූ නවාංග පෙන්වා දෙයි.<br>• ලන්දේසි පාලන ප්‍රදේශ සිතියමක ලකුණු කර නම් කරයි. | II වාරය<br>10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 4.1 ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු විමසා බලයි.<br><br>4.2 ක්‍රි.පූ. 6 වන සියවසේ සිට මෞර්ය අධිරාජ්‍ය ඉතිහාසයේ අවසානය දක්වා ඉන්දීය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්‍ෂණ විමර්ශනය කරයි. | • ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය.<br>○ ග්‍රීසිය හා රෝමය,<br>○ ආරම්භය හා ව්‍යාප්තිය<br>○ පාලන කටයුතු<br>○ කෘෂිකර්මය හා වෙළඳ කටයුතු<br>○ ආගම, කලාව හා ජන ජීවිතය<br><br>• ක්‍රි.පූ. 6 වන සියවසේ සිට මෞර්ය අධිරාජ්‍ය බිඳ වැටීම දක්වා දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණවල වැදගත්කම | • ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය විස්තර කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලන සමය හා ආර්ථික කටයුතු පැහැදිලි කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කර නම් කරයි.<br>• මෞර්ය අධිරාජ්‍යයේ නැගීම විස්තර කරයි.<br>• ක්‍රි.පූ. 6 වන සියවසේ සිට මෞර්ය අධිරාජ්‍ය දක්වා ඉන්දියාවේ සමාජ, ආර්ථික තත්ත්වය විස්තර කරයි. | 16 |
| 05. ආසියාතික රටවල ථෙරවාදී බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය පෙන්වා දෙයි | 5.1 ආසියානු බෞද්ධ සංස්කෘතීන් විමසා බලයි. | • අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය<br>• මියන්මාරය (බුරුම),තායිලන්තය (සියම) හා කාම්බෝජ යන රටවල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය පිළිබඳ තොරතුරු | • අග්නිදිග ආසියාවට බුදු දහම ව්‍යාප්ත වූ අයුරු විස්තර කරයි.<br>• අග්නිදිග ආසියාවේ ථෙරවාදී බෞද්ධ කටයුතු පැහැදිලි කරයි.<br>• අග්නිදිග ආසියාවේ බෞද්ධ මධ්‍යස්ථාන සිතියමක ලකුණු කර නම් කරයි. | III වාරය<br><br>22 |

# මූලික පිරිවෙන් විෂය නිර්දේශය - ඉතිහාසය -5 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආදේශ කර ගනියි. | 1.1 ඉතිහාසය යන්න අර්ථ දක්වයි/ නිර්වචනය කරයි.<br>1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පෙන්වා දෙයි.<br>1.3 ඉතිහාසය ගොඩනැගීමට දයක වන මූලාශ්‍රය පිළිබඳ විමසා බලයි. | • ඉතිහාසය යනු කුමක් ද?<br>• ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන<br>• ලංකා ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය<br>◦ සාහිත්‍ය මූලාශ්‍රය<br>◦ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය<br>◦ නානක මූලාශ්‍රය | • ඉතිහාසය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය නම් කරයි.<br>• මූලාශ්‍රය වර්ග කරයි.<br>• මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙයි. | 16 |
| 02. රටක ඉතිහාසය ගොඩනැගීමේ දී ඓතිහාසික සාධක බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 2.1 ගෝලීය පිහිටීම ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය විමර්ශනය කරයි. | • ශ්‍රී ලංකාවේ පිහිටීම<br>• ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පිහිටීම පිළිබඳ විශේෂ කරුණු<br>• ලංකාවේ පූර්ව ඓතිහාසික තොරතුරු<br>• ජනාවාස හා භාරතීය ජන සංක්‍රමණ ව්‍යාප්තිය<br>• අනුරාධපුර රාජධානිය බිහිවීම කෙරෙහි බලපෑ භූ ගෝලීය සාධක | • ශ්‍රී ලංකාවේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම විස්තර කරයි.<br>• භූ ගෝලීය පිහිටීම ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පෙන්වා දෙයි.<br>• භූ ගෝලීය පිහිටීම සිතියම ඇසුරෙන් පෙන්වා දෙයි. | 10 |
| 03. ශ්‍රී ලංකාවට බුදු දහමේ සම්ප්‍රාප්තිය හා ව්‍යාප්තිය පෙන්වා දෙයි. | 3.1 අශෝක රජුගේ ධර්මදූත සේවය හා එහි බලපෑම විමර්ශනය කරයි. | • අශෝක ධර්මදූත සේවය හා මහින්දගමනය<br>• දෙවන පෑතිස් / දේවානම්පියතිස්ස රාජ්‍ය සමය<br>• බුදු සසුන පිහිටුවීම හා එය ලංකා ඉතිහාසය කෙරෙහි ඇති කළ විවිධ බලපෑම් | • ශ්‍රී ලංකාවේ බුදුදහම ව්‍යාප්ත වීම හා ස්ථාපිත වීම පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරය ගොඩනැගීම සඳහා බුදු දහමින් ලද ආභාසය පෙන්වා දෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 4.1 අනුරාධපුර රාජධානියෙහි දේශපාලන, ආර්ථික හා සංස්කෘතික තෙරතුරු විමර්ශනය කරයි. | • අනුරාධපුර රාජධානියෙහි දේශපාලන, ආර්ථික හා සංස්කෘතික තත්ත්වය<br>• අනුරාධපුර රාජධානියෙහි පැරණි තාක්‍ෂණය (වාරි කර්මාන්තය, ගෘහ නිර්මාණ හා ප්‍රවාහන ක්ෂේත්‍රය, වෛද්‍ය ක්ෂේත්‍රය හා වෙනත් ක්ෂේත්‍රයන්)<br>• අනුරාධපුර රාජධානියෙහි පරිහානිය හා බිඳ වැටීම කෙරෙහි බලපෑ දේශපාලන, ආර්ථික, සාමාජික හා වෙනත් හේතු | • අනුරාධපුර රාජධානියේ දේශපාලන, සමාජ, ආර්ථික තොරතුරු විස්තර කරයි.<br>• අනුරාධපුර සමයේ විදේශ සබඳතා පැහැදිලි කරයි.<br>• පුරාණ තාක්ෂණිකාංග පැහැදිලි කරයි. | 16 |
| 05. ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 5.1 පොළොන්නරු රාජධානියේ ආරම්භය, විකාශය හා පරිහානිය පැහැදිලි කරයි. | • අභ්‍යන්තර දේශපාලන තත්වය<br>• චෝල බලය පොළොන්නරුවේ පිහිටුවීම<br>• I වන විජයබාහු රාජ්‍ය සමය<br>• I වන පරාක්‍රමබාහු රාජ්‍ය සමය<br>• නිශ්ශංකමල්ල රජු හා පොළොන්නරු රාජ්‍යයේ පසුකාලීන රජවරු<br>• පොළොන්නරු යුගයේ දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික කටයුතු<br>• පොළොන්නරු රාජධානියේ පැරණි තාක්‍ෂණය<br>• කාලිංග මාඝ ආක්‍රමණය හා පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම | • පොළොන්නරු රාජධානියේ දේශපාලන, සමාජ හා ආර්ථික තොරතුරු විස්තර කරයි.<br>• පොළොන්නරු සමයේ විදේශ සබඳතා පැහැදිලි කරයි.<br>• පුරාණ තාක්ෂණිකාංග විස්තර කරයි.<br>• කාලිංග මාඝ ආක්‍රමණය හා පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම පිළිබඳ තොරතුරු රැස් කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 06. ශ්‍රී ලාංකික ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 6.1 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා තොරතුරු විස්තර කරයි. | • දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා දේශපාලන, ආගමික හා සංස්කෘතික වැදගත්කම<br>• අදළ කාලපරිච්ඡේදය තුළ පැවති අධ්‍යාපන හා සාහිත්‍ය දියුණුව | • දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා දේශපාලන, සමාජ හා සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කරයි.<br>• රාජධානි විතැන්වීම සිතියමක ලකුණු කර නම් කරයි. | 06 |
| 07. ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍ය පිළිබඳව අධ්‍යයනය කර තම ස්වාධිපත්‍ය රැක ගැනීමේ වැදගත්කම වටහා ගනී. | 7.1 ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි. | • ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම<br>• බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැන නැගුණු ස්වදේශීය ප්‍රතිවිරෝධතා<br>• ආණ්ඩුක්‍රම විකාශනය<br>• ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය<br>• බ්‍රිතාන්‍ය පාලන සමයේ ලංකාවේ ඇති වූ දේශපාලන, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික වෙනස්කම් | • බ්‍රිතාන්‍ය පාලනය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වූ ආකාරය පහදයි.<br>• ස්වදේශීය ප්‍රතිවිරෝධතා පෙන්වා දෙයි.<br>• බ්‍රිතාන්‍ය පාලනය නිසා ඇති වූ නවාංග හා බලපෑම පෙන්වා දෙයි. | 08 |